සැ. යු. - 2013.09.27 වැනි දින පළවූ අංක 1830 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,831 - 2013 ඔක්තෝබර් මස 04 වැනි සිකුරාදා - 2013.10.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 848 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | 849 |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 862 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 ඔක්තෝබර් මස 25 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ඔක්තෝබර් මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

# රජයේ නිවේදන

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/24/2013/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමු වැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2013.10.04 වැනි දින සිට 2013.10.18 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව අනුරාධපුරය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම් කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2013.10.25 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| අනුරාධපුර දිස්ත්‍රික්කයේ, අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්ඩීඕ 73/49 දරන පත්ඉරුව | උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් කෝරළයේ එගොඩගම පිහිටි අංක 757 දරන ඉඩමට මායිම්,<br>*උතුරට :* අයි. එස්. පී. පී. 2හි කැබලි අංක 756 සහ 747<br>*නැගෙනහිරට :* අයි. එස්. පී. පී. 2හි කැබලි අංක 367 සහ 758<br>*දකුණට :* අයි. එස්. පී. පී. 2හි කැබලි අංක 758<br>*බස්නාහිරට :* අයි. එස්. පී. පී. 2හි කැබලි අංක 756<br>ප්‍රමාණය : අ. 02, රූ. 00, පර්. 27 | 01. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිතුමිය විසින් ප්‍රදානය කරන ලද අංක අනු/නැනුප/ප්‍ර 504/1995.12.05 දරන දීමනාපත්‍රය |

10-54

---

**උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ වාර්ෂික මහා පෙරහැර - 2013**

1. උග්ගල් අලුත් නුවර කතරගම දේවාලයේ ඇසළ උත්සවය 2013 ඔක්තෝබර් මස 14 වැනි දින ආරම්භ වී ඔක්තෝබර් මස 19 වැනි දින දිය කැපීමෙන් අවසන් කෙරේ.

2. දේවාලභූමියේ උඩ වීදිය, නැගෙනහිර පෙදෙස බටහිර පෙදෙස වන පිරිත්වත්ත, ගල්වත්ත, මාළුකාර වත්ත හා උතුරු දෙසින් පිහිටි උඩහ ගෙදරවත්ත යන ප්‍රදේශ පෙරහැරට පැමිණෙන නැටුම් කණ්ඩායම්, වන්දනා කරුවන් ලැගුම් ගන්නා ප්‍රදේශ ලෙස නම් කෙරේ.

3. විහාර මළුව, බෝ මළුව, චෛත්‍ය මළුව, දේවාලය අවට පහත මාලය, කලායතන රථගෙය මැදවත්ත හා ඒ අවට ප්‍රදේශය තුළ ආහාර පිසීම තහනම් කෙරේ.

4. උත්සව භූමිය තුළ වෙළඳාම් කිරීම සඳහා වෙන් කරනු ලබන බිම් කොටස් බදු දෙන ආකාරය දැන්වීම් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

* උත්සව කාලය තුළ වෙළඳාම් කිරීම සඳහා බදු දෙනු ලබන තාවකාලික කඩබිම් තුළ හා ඒ අවට නීත්‍යානුකූල නොවන භාණ්ඩ ප්‍රදර්ශනය කිරීම, විකිණීම සපුරා තහනම් ය.

* ඩෙංගු මර්දනය සඳහා සියළු තාවකාලික කඩ හිමියන් විසින් ඉවත දමනු ලබන සියලු අපද්‍රව්‍යය, ස්ථාන ගතකර ඇති බඳුන් වලට පමණක් බැහැර කළ යුතු ය.

5. දේවාල උඩ මළුව, මැද වීදිය, මළුවට පිවිසෙන මාර්ගය හා ඒ දෙපස ප්‍රදේශ තුළ මල්, සුවඳ ද්‍රව්‍ය, ඉටි පන්දම් හා බාර හාර සඳහා අවශ්‍ය පූජා භාණ්ඩ විකිණීම සපුරා තහනම් ය.

6. විනෝද ක්‍රීඩා වෙනුවෙන් පැනවෙන නීති, මෙම සියළුම කටයුතු සඳහා බස්නායක නිලමේ තුමාගෙන් අවසර ලබා ගත යුතු අතර ප්‍රාදේශීය සභාව මගින් ඉල්ලා සිටිනු ලබන බද්ද, ක්‍රීඩාව පවත්වා ගෙන යනු ලබන අය විසින් ගෙවිය යුතු ය. එකී ක්‍රීඩා සඳහා ශබ්ද වාහිනි යන්ත්‍ර භාවිත කරන්නේනම් ගරු අධිකරණයේ අවසර ලබාගතයුතු අතර මහ පෙරහැරේ වීදි බැසීමත් සමග සියලු කටයුතු තාවකාලිකව නතරකළ යුතු ය. පෙරහැර අවසන් වූ පසු අවශ්‍ය නම් එම කටයුතු පැවැත්විය හැකිය.

7. ඉහත අංක 4, 6 යන වගන්ති වලින් නියම කර ඇති භූමිය තුළ හැර වෙනත් කිසිම ස්ථානයක වෙළඳාම් කිරීම හා මුදල් උපයන කිසිදු ක්‍රියාවක් නොකළ යුතු ය.

8. දේවාල භූමියේ හා උඩ මළුවේ බීමතින් හැසිරීම, දුම්වැටි භාවිතය සපුරා තහනම් ය.

9. අලි ඇතුන් ගාල් කර ඇති ස්ථානයන්හි නිකරුණේ ගැවසීම නොකළ යුතු අතර සතුනට ආහාර සැපයීමට නොයා යුතු ය.

10. උත්සව භූමියට වාහන ඇතුල් කිරීමට ඉඩ දෙනු ලබන්නේ ඇසළ උත්සවය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රය ඇති වාහන වලට පමණි. ඒ අනුව පහත සඳහන් මාර්ග වාහන ගමනාගමනයට ඉඩ දෙනු නොලැබේ.

* කොළඹ බදුල්ල ප්‍රධාන මාර්ගයෙන්, අළුත් නුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල හන්දියෙන් දේවාල භූමියට පිවිසෙන මාර්ගය

* තොටපල්ල, පොකුණගම ප්‍රදේශයෙන් දේවාල භූමියට පිවිසෙන මාර්ගය

* පිරිත් වත්ත, ගල්වත්ත, දේවාල ප්‍රදේශයෙන් දේවාල භූමියට පිවිසෙන මාර්ගය.

11. දේවාල භූමියට පැමිණෙන අවසර ලත් වාහන ගාල්කර තැබීම සඳහා පහසුකම් පාසල් ක්‍රීඩා පිටියේ සලසා ඇත.

12. දේවාලයේ දිග්ගෙය, මාලිගාවේ ඉහල මාලය ඡායා රූප ගැනීම හා රූගත කිරීම අනුමැතියකින් තොරව සිදුකිරීම සපුරා තහනම් කෙරේ.

චම්පික නිරෝෂ් ධර්මපාල,
ප්‍රාදේශීය ලේකම් (වැ. බ.)
ඉඹුල්පේ.

10-151

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## කැලණිය විශ්වවිද්‍යාලය

### ආදායම් ප්‍රකාශනය

**දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා**

| *ආදායම* | *සටහන* | *2011* *රු.* | *2010* *රු.* |
|---|---|---|---|
| **රජයේ ප්‍රදාන** | | | |
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන | 2 | 1,150,121,000 | 973,000,000 |
| පුනරුත්ථාපනය හා වත්කම් වැඩිදියුණු කිරීම සඳහා රජයේ ප්‍රදාන | | 17,030,527 | 11,910,348 |
| ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය | | 125,393,756 | 14,312,566 |
| | | 1,292,545,283 | 999,222,914 |
| **වෙනත් ආදායම්** | | | |
| ලියාපදිංචි ගාස්තු (උපාධි අපේක්ෂක) | | 7,491,201 | 8,451,790 |
| ලියාපදිංචි ගාස්තු (පශ්චාත් උපාධි) | | 684,069 | 563,000 |
| ශිෂ්‍ය උපදේශ ගාස්තු (උපාධි අපේක්ෂක) | | 307,175 | 215,750 |
| ශිෂ්‍ය උපදේශක (පශ්චාත් උපාධි) | | 614,754 | 513,955 |
| විභාග ගාස්තු (උපාධි අපේක්ෂක) | | 587,335 | 1,359,090 |
| විභාග ගාස්තු (පශ්චාත් උපාධි) | | 200,775 | 145,705 |
| අයෝජනවලින් පොළිය | | 35,295,603 | 31,447,011 |
| ණය පොළී | | 1,656,301 | 1,659,505 |
| ප්‍රකාශන අලෙවියෙන් ලැබූ මුදල් | | 128,755 | 8,512 |
| දේපළ කුලිය | | 492,027 | 669,092 |
| පුස්තකාල දඩ මුදල් | | 413,556 | 410,236 |
| වෛද්‍ය ගාස්තු | | 7,460 | - |

| *ආදායම* | *සටහන* | *2011* *රු.* | *2010* *රු.* |
|---|---|---|---|
| උපකාරක සේවා - නේවාසිකාගාර | | 2,279,486 | 3,157,575 |
| පැරණි තොග විකිණීමෙන් ලැබූ මුදල් | | 145,270 | 54,368 |
| විවිධ ආදායම් | 3 | 32,598,792 | 18,781,146 |
| බාහිර විභාගවලින් ලැබෙන ආදායම | 4 | 189,593,848 | 118,053,078 |
| ගාස්තු අය කරන පාඨමාලා/විශේෂ සේවාවලින් ලැබෙන ආදායම | | 121,464,708 | 129,846,112 |
| විශ්වවිද්‍යාලය දායකවන සම්මන්ත්‍රණ ගාස්තු | | 997,148 | 7,018,838 |
| **මුළු ආදායම** | | **1,687,503,546** | **1,321,577,677** |
| **වියදම්** | | | |
| පෞද්ගලික පාරිතෝෂිත | 5 | 923,500,317 | 755,317,833 |
| ගමන් වියදම් | 6 | 2,615,030 | 7,053,483 |
| සැපයුම් | 7 | 69,954,649 | 55,182,465 |
| නඩත්තු වියදම් | 8 | 10,332,566 | 8,345,225 |
| කොන්ත්‍රාත් සේවා | 9 | 174,103,223 | 155,081,276 |
| වෙනත් පුනරාවර්තන | 10 | 53,271,906 | 57,527,407 |
| ක්ෂයවීම් | | 261,661,121 | 260,525,083 |
| පාරිතෝෂිත වෙන් කිරීම් | | 25,295,220 | 13,324,101 |
| ගාස්තු අය කරන පාඨමාලා/විශේෂ සේවාවලට වියදම් | | 76,802,246 | 111,172,441 |
| පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් වියදම් | | 17,030,527 | 11,910,348 |
| **මුළු වියදම්** | | **1,614,566,804** | **1,435,439,662** |
| **කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(හිඟය)** | | **72,936,741** | **(113,861,985)** |

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

**දෙසැම්බර් මස 31 දිනට**

| *වත්කම්* | *සටහන* | *2011* *රු.* | *2010* *රු.* |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත හා උපකරණ | 11 | 3,117,494,942 | 3,138,016,209 |
| කෙරීගෙන යන වැඩ | 12 | 437,069,274 | 361,117,657 |
| ආයෝජන | 13 | 767,247,815 | 628,849,622 |
| **ජංගම වත්කම්** | | | |
| බඩු ලේඛනය | 14 | 28,149,620 | 21,465,997 |
| විවිධ ණයගැතියෝ | 15 | 100,000 | 1,034,259 |
| තැන්පතු හා අත්තිකාරම් | 16 | 50,281,864 | 53,528,555 |
| පෙර ගෙවීම් | 17 | 1,127,031 | 612,683 |
| ලැබිය යුතු දෑ | 18 | 23,960,416 | 44,321,486 |
| මුදල් හා මුදල් සමාන දේ | 19 | 174,412,997 | 147,630,935 |
| | | **278,031,928** | **268,593,915** |
| **මුළු වත්කම්** | | **4,599,843,959** | **4,396,637,403** |

| වත්කම් | සටහන | 2011 රු. | 2010 රු. |
|---|---|---|---|
| **සාමාන්‍ය කොටස් හා බැරකම් ප්‍රාග්ධනය** | | | |
| විලම්භිත ප්‍රාග්ධන ප්‍රදාන | **20** | 2,531,594,632 | 2,362,934,458 |
| වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන | **21** | 19,722,469 | (15,219,443) |
| | | **2,551,317,101** | **2,347,715,015** |
| **සමුච්චිත අරමුදල** | | | |
| අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිත ඉදිකිරීම් ව්‍යාපෘති අරමුදල | | 62,165,273 | 80,909,035 |
| වත්කම් ප්‍රති ඇගයුම් සංචිතය | | 2,502,382,782 | 2,502,382,782 |
| පොදු සංචිතය | | (1,388,348,420) | (1,172,021,820) |
| | | **1,176,199,635** | **1,411,269,997** |
| **සංචිත හා සීමා කළ අරමුදල්** | | | |
| විශේෂ ප්‍රදාන | **23** | 136,040,964 | 84,135,345 |
| පර්යේෂණ ප්‍රදාන | **24** | 87,485,966 | 65,661,587 |
| ත්‍යාග හා පරිත්‍යාග | **25** | 8,683,798 | 2,920,615 |
| වෙනත් සංචිත | **26** | 34,476,643 | 27,774,841 |
| අත්තිකාරම් ලෙස ලැබුණු ආදායම | **27** | 190,674,625 | 273,120,141 |
| | | **2,717,379** | **2,717,379** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | **28** | 302,474,226 | 68,003,666 |
| බැදීම් සඳහා ප්‍රතිපාදන | **29** | 455,580 | 455,580 |
| | | **302,929,806** | **68,459,246** |
| **ජංගම බැරකම්** | | | |
| ගෙවිය යුතු ගිණුම් | **30** | 20,564,041 | 18,356,048 |
| උපචිත වියදම් | **31** | 57,166,920 | 59,184,773 |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | **32** | 34,304,461 | 38,039,795 |
| | | **112,035,421** | **115,580,616** |
| | | **4,599,843,959** | **4,396,637,403** |

මෙම මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ සහ වෙනත් ව්‍යවස්ථාමය විධිවිධානවල අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

යූ. ටී. එම්. අයි. ඩී. තෙන්නකෝන්,
මූල්‍යාධිකාරී.

විශ්වවිද්‍යාල පාලක සභාව සඳහා සහ ඒ වෙනුවෙන් අත්සන් කරන ලද මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා විශ්වවිද්‍යාල පාලක සභාව වගකීම දරනු ලබයි.

මාහාචාර්ය සරත් අමුණුගම,
උපකුලපති.

ඩබ්ලිව්. එම්. කරුණාරත්න,
ලේඛකාධිකාරී.

6 වැනි පිටුවේ සිට 24 වැනි පිටුව දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත කොටසක් වේ.

කැලණිය,
2012 පෙබරවාරි මස 28 වැනි දින.

*මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ වගකීම් පිළිබඳ ප්‍රකාශනය*

අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා විශ්වවිද්‍යාල පාලක සභාව වගකිව යුතු ය. මූල්‍ය ප්‍රකාශන මගින් විශ්වවිද්‍යාලයේ කටයුතු සම්බන්ධව සහ එම කාල පරිච්ඡේදයේ එහි ක්‍රියාකාරීත්වය සම්බන්ධව සත්‍යය හා සාධාරණ දැක්මක් ඉදිරිපත් වන බවට සෑහීමකට පත් වන්නේ නම් මිස පාලක සභාව විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත නොකළ යුතු වේ. පාලක සභාව විසින් පහත දැක්වෙන පරිදි කටයුතු කිරීම අවශ්‍ය කෙරේ.

* සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ ඒවා අඛණ්ඩව අදාළ කිරීම.
* යුක්ති සහගත සහ ඥානාන්විත තීන්දු ගැනීම සහ ඇස්තමේන්තු කිරීම.

විශ්ව විද්‍යාලයේ කාර්යසාධනය සහ මූල්‍ය තත්ත්වය පෙන්වීමට සහ පැහැදිලි කිරීමටත් ඕනෑම අවස්ථාවක දී සාධාරණ නිවැරදිතාවයක් ඇතිව එළිදරව් කිරීමටත් ප්‍රමාණවත් ගිණුම්කරණ වාර්තා තබා ගැනීම සම්බන්ධව පාලක සභාව වගකිව යුතු වේ.

*පාලක සභාවේ වගකීම් ප්‍රකාශනය* :

සාමාජිකයන් විසින් සිය උපරිම දැනීමේ හැටියට පහත දැක්වෙන පරිදි තහවුරු කරනු ලබති.

අදාළ නීතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බවටත් ඒවා මගින් විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ කාර්යසාධනය පිළිබඳව සත්‍යය හා සාධාරණ අදහස් නිරූපණය කරන බවටත්.

කැළණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාව වෙනුවට,

මහාචාර්ය සරත් අමුණුගම,
උපකුලපති.

2012 පෙබරවාරි මස 28 වැනි දින.

10-50

---

## යාපනය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

2010 වසරෙහි දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන වසර සඳහා වන මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රකාශනය

| | *2010 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන වසර සඳහා රුපියල්* | *2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන වසර සඳහා රුපියල්* |
|---|---|---|
| **මෙහෙයුම් ආදායම** | | |
| පුනරාවර්තන ප්‍රතිපාදන | 536,400,000.00 | 649,600,000.00 |
| ශුද්ධ ආදායම/ (අලාභ) අනෙකුත් ක්‍රියාකාරකම්වලින් | 11,591,454.90 | 11,578,911.44 |
| අනෙකුත් ආදායම් | 16,807,744.67 | 12,232,537.21 |
| පොදු සංචිතයෙන් ලද අරමුදල් | 119,000,000.00 | - |
| | **683,799,199.57** | **673,411,448.65** |
| ශිෂ්‍යයන් සඳහා මූල්‍යමය ආධාර | 71,643,050.00 | 62,945,050.00 |
| | **755,442,249.57** | **736,356,498.65** |
| **මෙහෙයුම් වියදම්** | | |
| සේවක පඩිනඩි/පාරිශ්‍රමික | 546,416,968.88 | 507,592,088.19 |
| ප්‍රවාහන | 4,731,035.48 | 5,376,087.96 |
| සැපයුම් සහ පාරිභෝජන භාවිතය | 29,783,040.35 | 23,472,187.66 |
| නඩත්තුකරණය | 10,169,353.81 | 8,344,481.42 |

| | *2010 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන වසර සඳහා රුපියල්* | *2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන වසර සඳහා රුපියල්* |
|---|---|---|
| ගිවිසුම්සහගත සේවා | 49,900,466.66 | 40,531,477.36 |
| පර්යේෂණ සහ සංවර්ධන | 142,314.10 | 167,650.10 |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම් | 86,036,142.70 | 101,953,469.37 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 31,076,835.42 | 22,774,283.33 |
| **සමස්ත මෙහෙයුම් වියදම්** | **758,256,157.40** | **710,211,725.39** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් අතිරික්තය/(හිඟය) | (2,813,907.83) | 26,144,773.26 |
| ශිෂ්‍යයන් සඳහා මූල්‍යමය ආධාර | 71,643,050.00 | 62,945,050.00 |
| **සමස්ත ක්‍රියාකාරකම්වලින් අතිරික්තය/(හිඟය)** | **(74,456,957.83)** | **(36,800,276.74)** |
| අතිවිශේෂ අයිතමයන් (කපාහැරීම් සහ අනෙකුත් ගැලපුම්) | 449,562.03 | 348,369.65 |
| අදාල කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/(හිඟය) පොදු සංචිතයට මාරු කිරීම් | **(74,906,512.86)** | **(37,148,646.39)** |

නිවැරදි බවට සහතික කළෙමු

මහාචාර්ය වී. අරසරත්නම්,
ගිණුම්කරණ නිලධාරි,
උපකුලපති.

එස්. සී. රාමක්‍රිෂ්ණන්,
මූල්‍යාධිකාරි.

2010 වසරෙහි දෙසැම්බර් මස 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | *2010 දෙසැම්බර් මස 31 වැනි දිනට රු.* | *රු.* | *2009 දෙසැම්බර් මස 31 වැනි දිනට රු.* | *රු.* |
|---|---|---|---|---|
| **වත්කම් :** | | | | |
| ජංගම නොවන වත්කම් | | | | |
| දේපළ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 863,604,312.46 | | 716,419,003.84 | |
| ආයෝජන (දිගු කාලීන) | 201,051,753.62 | | 171,558,664.80 | |
| ප්‍රාග්ධන නොනිමි වැඩ | 59,408,750.00 | **1,124,064,816.08** | 203,667,546.53 | **1,091,645,215.17** |
| **ජංගම වත්කම් :** | | | | |
| ඉන්වෙන්ටරි/තොග | 16,067,128.97 | | 13,454,948.95 | |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු | 376,485,373.50 | | 313,394,117.44 | |
| ආයෝජන (කෙටි කාලීන) | 7,390,773.67 | | 6,742,196.34 | |
| මුදල් සහ මුදල් සම | 189,331,659.94 | **589,274,936.08** | 330,001,393.15 | **663,592,655.88** |
| **සමස්ත වත්කම්** | | **1,713,339,752.16** | | **1,755,237,871.05** |
| වගකීම් : | | | | |
| *ජංගම වගකීම්* | | | | |
| ගෙවිය යුතු | 16,981,385.09 | | 23,147,603.05 | |
| උපචිත වියදම් | 4,763,075.39 | | 3,658,849.67 | |
| ස්වයං මූල්‍ය පාඨමාලා | 66,358,121.54 | **88,102,582.02** | 56,533,031.64 | **83,339,484.36** |
| *ජංගම නොවන වගකීම්* | | | | |
| *ගෙවිය යුතු* | 4,979,843.89 | | 4,307,936.40 | |
| පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් | 178,398,183.50 | **419,248,834.29** | 173,430,880.25 | **382,454,879.36** |
| පරිමිත අරමුදල | 235,870,806.90 | | 204,716,062.71 | |
| සමස්ත වගකීම් | | **507,351,416.31** | | **465,794,363.72** |
| **සමස්ත ශුද්ධ වත්කම් :** | | **1,205,988,335.85** | | **1,289,443,507.33** |
| ශුද්ධ වත්කම්/ව්‍යාපාර වස්තු අගය | | | | |
| එක්රැස් අරමුදල (ප්‍රාග්ධන ප්‍රතිපාදන) | 2,079,969,079.00 | | 1,968,581,754.50 | |

| | 2010 දෙසැම්බර් මස 31 වැනි දිනට රු. | රු. | 2009 දෙසැම්බර් මස 31 වැනි දිනට රු. | රු. |
|---|---|---|---|---|
| **සංචිත :** | | | | |
| පොදු සංචිත | (1,028,085,872.97) | | (822,459,627.30) | |
| බැඳුම්කර සංචිත | 154,047,269.82 | | 143,263,520.13 | |
| ප්‍රාග්ධන සංචිත | 57,860.00 | 1,205,988,335.85 | 57,800.00 | 1,289,443,507.33 |
| සමස්ත ශුද්ධ වත්කම්/අගයන් | | 1,205,988,335.85 | | 1,289,443,507.33 |
| සමස්ත වගකීම් | | 507,351,416.31 | | 465,794,363.72 |
| සමස්ත වගකීම් සහ අගයන් | | 1,713,339,752.16 | | 1,755,237,871.05 |
| සමස්ත අරමුදල් ක්‍රියාකාරිත්වය | | | | |

නිවැරදි බවට සහතික කළෙමු

මහාචාර්ය වී. අරසරත්නම්,
ගිණුම්කරණ නිලධාරි,
උපකුලපති.

එස්. සී. රාමක්‍රිෂ්ණන්,
මූල්‍යාධිකාරි.

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**

උපකුලපති,
යාපනය විශ්වවිද්‍යාලය

**යාපනය විශ්වවිද්‍යාලයේ 2010 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

යාපනය විශ්වවිද්‍යාලයේ 2010 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) සහ III වගන්ති සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) සහ (7) උපවගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත 2011 අප්‍රේල් මස 29 වැනි දින ඉදිරිපත් කරන ලදී.

1.2 *මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම*

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.3 *විගණන විෂයය පථය සහ මතය සඳහා පදනම*

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණනය මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂයය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍යවන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂයය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

2. මූල්‍ය ප්‍රකාශන :

2.1 *මතය*

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, යාපනය විශ්වවිද්‍යාලය 2010 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු

වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් මස 31 වැනි දිනට යාපනය විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

2.2.1 *ගිණුම්කරණ ප්‍රතිපත්ති*

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ :

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 ප්‍රකාරව සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම් වෙනුවෙන් ක්ෂය කිරීම වැළැක්වීම සඳහා දේපළ, පිරියත සහ උපකරණ වෙනුවෙන් ක්ෂය කිරීම වෙන් වෙන්ව ගණනය කළ යුතු වුවද විශ්වවිද්‍යාලය විසින් එයට පටහැනිව වත්කම්වල මුළු වටිනාකම මත ක්ෂය කිරීම් කර තිබුණි. එම නිසා ගිණුම්වල දක්වා තිබුණු රු. 81,068,839ක් වූ ක්ෂය කිරීම් එක් එක් වත්කම සඳහා නිවැරදිව හෙළිදරව් කර තිබුණේ ද යන්න තහවුරු කළ නොහැකි විය ;

(ආ) 1995 ඔක්තෝබර් මස 05 වැනි දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 649 හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18ට අනුව ඉඩමේ වටිනාකම සඳහා ක්ෂය ගණනය නොකළ යුතු ය. කෙසේ වුවද ඉඩම සහ ගොඩනැගිල්ලේ වටිනාකම වෙන වෙනම හඳුනාගැනීමට නොහැකි වීම මත ඉඩම සඳහා ද 5%ක ක්ෂය කිරීමක් කර තිබුණි ;

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 3 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ සකන්ධ වෙනස් වීමේ ප්‍රකාශනයක් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි ;

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 අනුව පොත් අගය ශුන්‍ය වී ඇති නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගන්නා ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්වල පෙන්නුම් කර නොතිබුණි.

2.2.2 *ගිණුම්කරණ අඩුපාඩු*

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය :

(අ) රු. 2,191,072ක් වටිනා පොත් හා වාර සඟරා 117ක් විශ්වවිද්‍යාලයට ලැබී නොතිබුණු නමුත්, වැරදි සහගත ලෙස පොත් හා වාර සඟරා ගිණුමට ඇතුළත් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී නිම කරන ලද රු. 10,288,850ක ඉදිකිරීම් වැඩ ඉඩම් හා ගොඩනැගිලි ගිණුම් යටතේ පෙන්නුම් කිරීම වෙනුවට කෙරී යන වැඩ ලෙස ගිණුමේ දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ඉන්දියානු රජය විසින් පරිත්‍යාග කරන ලද බස් රථ තුනක (සිටි රයිඩර්) අගය තක්සේරු කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඈ) රිදී ජුබිලි අරමුදලින් රු. 243,100ක මුදලකට මිලදී ගෙන තිබූ ත්‍රීරෝද රථයක් 2006 වර්ෂයේ සිට ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඉ) වැඩියෙන් අයකරන ලද ඇපකර වගකීම්වල එකතුවක් වූ රු. 2,178,090ක් ගෙවිය යුතු මුදලක් ලෙස ගිණුම්වල වෙනම පෙන්නුම් කරනු වෙනුවට ලැබිය යුතු ඇපකර වගකීම් ගිණුමට හිලව් කර තිබුණි.

2.2.3 *ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්*

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ :

(අ) 2007 සිට 2008 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව නිරවුල් නොකරන ලද විවිධ ණය හිමියන්ගේ ශේෂය සමාලෝචිත වර්ෂයේ අවසානයට රු .2,21,675ක් විය.

(ආ) එකතුව රු. 157,349,632ක් වූ සැපයුම් අත්තිකාරම්, අවතැන්වූ කාර්ය මණ්ඩලයට වැටුප් අත්තිකාරම්, ගොඩනැගිලි අත්තිකාරම්, විවිධ ණයගැති අත්තිකාරම් සහ කාර්ය මණ්ඩල ණය ශේෂ වර්ෂ 01 සිට 23 දක්වා වූ කාල පරාසයක් තුළ අය කරගෙන නොතිබුණි. එම නිසා මෙම ශේෂයන් අයකර ගැනීම සැක සහිතය.

(ඇ) 1997 දී අධ්‍යයන කාර්ය මණ්ඩලයට වැඩිපුර ලබා දුන් රු. 37,455ක් වූ පොත් දීමනාව මේ දක්වා අයකර ගෙන නොතිබුණි.

(ඈ) විගණනයට ලැබී තිබුණු තොරතුරු අනුව 2000 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ඇපකර හා ගිවිසුම් කඩ කරන ලද ආචාර්යවරුන් 133 දෙනෙකුගෙන් රු. 117,530,741ක් මුදලක් ලැබිය යුතුව තිබුණි. කෙසේ වුවත් එම ආචාර්යවරුන්ගෙන් මෙම මුදල් අයකර ගැනීමට 2011 ජුනි මස 30 දක්වා නියමිත ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.2.4 *විගණනය සඳහා සාක්ෂි නොවීම*

වටිනාකම රු. 1,750,016,314ක් වූ වත්කම්, ගෙවිය යුතු මුදල්, ලැබිය යුතු මුදල් සහ ක්ෂයවීම් වලට අදාළ සත්‍යාපන වාර්තා, තහවුරු කිරීම්, කාල විශ්ලේෂන, විස්තරාත්මක උපලේඛන යනාදී නොමැති වීම හේතුකොට ගෙන විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

2.2.5 *නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්*

පහත සඳහන් නීති, භාණ්ඩාගාර චක්‍රලේඛ, රජයේ මුදල් රෙගුලාසි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී ජනරජයේ ආයතන සංග්‍රහය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය ආදියට අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153 හා 155 වගන්ති

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 03, 16 හා 18

(ඇ) මුදල් රෙගුලාසි

අංක 103(1), 104, 109, 264, 271(2) (ආ), 570, 571, 756, 845, 846 (3), 1645 සහ 1646

(ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය

v පරිච්ඡේදයේ 7:6 සිට 7:6:2 සහ 7.8 වගන්ති
xx පරිච්ඡේදයේ 3:1 වගන්තිය
xxiv පරිච්ඡේදයේ 3 :1 වගන්තිය
xxv පරිච්ඡේදයේ 2.2 (ඊ) වගන්තිය
xxvi පරිච්ඡේදයේ 2.4 සහ 5 වගන්ති
xxvi පරිච්ඡේදයේ 3.3 වගන්තිය
xxvii පරිච්ඡේදයේ 9:4 වගන්තිය

(ඉ) 1976 ජූලි 29 දිනැති අංක 828 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය

(ඊ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90, 1995 මාර්තු 16 දිනැති අංක 11/1995 සහ 2004 දෙසැම්බර් 27 දිනැති අංක 22/99 (iv) - 2004, 2009 අප්‍රේල් 16 දිනැති 9/2009 සහ 2009 ජූලි 17 දිනැති 09/2009 (1)දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ.

(උ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ

i. 1980 පෙබරවාරි 25 දිනැති අංක 63
ii. 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94
iii. 2010 පෙබරවාරි 15 දිනැති අංක 02/2010

(ඌ) 2007 ජනවාරි 18 දිනැති අංක 03 දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද එකතු කළ අගය මත බදු චක්‍රලේඛය

**3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මූල්‍ය සමාලෝචනය**

3.1.1 *මූල්‍ය ප්‍රතිඵල*

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ වැඩ කටයුතුවලින් පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු. 611,306,520 ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා අනුරූපී ඌනතාවය රු. 686,748,646 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රු. 536,400,000 ක් වූ රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂය සඳහා වූ ඌනතාවය රු. 74,906,520 ක් දක්වා අඩුවී තිබුණු අතර, ඉකුත් වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රු. 649,600,000 ක් වූ රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසුව එම වර්ෂයේ ඌනතාවය රු. 37,148,646 ක් දක්වා අඩුවී තිබුණි.

3.1.2 *නිශ්චිත අරමුදල් උපයෝජනය*

නිශ්චිත අරමුදල් සඳහා ලැබුණු රු. 29,493,089 ක මුදල, ඒවා ප්‍රදානය කරන ලද අරමුණු සඳහා උපයෝජනය කිරීමෙන් තොරව ස්ථාවර තැන්පත් ගිණුමට මාරු කර තිබුණි.

3.1.3 *ආර්ථික නොවූ ගනුදෙනු*

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ :

(අ) සමාලෝචිත වර්ෂයේ සෑම මාසයක් අවසානයේ දී ම උපාධි අධ්‍යයන පීඨයේ සහ බාහිර විභාග ඒකකයේ රු. මිලියන 179 ක සාමාන්‍ය මාසික මුදල් ශේෂයක් පැවති අතර, මෙම මුදල පොලී උපදවන පදනම මත ආයෝජනය කිරීමට සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මේ හේතුවෙන් සැලකිය යුතු මුදල් ආදායමක් විශ්වවිද්‍යාලයට අහිමි වී තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ අමුත්තන් සඳහා අමුත්තන්ගේ නිවාස පහසුකම් තිබුණු අතර, එම අමුත්තන්ගේ නිවාස සඳහා මුරකරුවෙක් පත්කර සමාලෝචිත වර්ෂය තුලදී එකතුව රු. 248,640 ක මුදලක් වැටුප් වශයෙන් ගෙවා තිබුණු නමුත් අමුත්තන් සඳහා විවිධ නවාතැන් වෙනුවෙන් නවාතැන් පහසුකම් ගාස්තු (ආහාර සහ නවාතැන්) ලෙස සමාලෝචිත වර්ෂයේදී රු. 528,459 ක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) ඉන්දියානු රජයෙන් බස් රථ තුනක් විශ්වවිද්‍යාලය වෙත ලැබී තිබුණ නමුත් මෙම බස් රථ භාවිතයට ගැනීම වෙනුවට පුද්ගලික වෑන් රථ කුලියට ලබාගැනීම සඳහා රු. 1,000,576 ක මුදලක් ගෙවා තිබුණි.

3.1.4 *වත්කම් කළමනාකරණය*

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ :

(අ) ස්කූටර් දෙකක් වර්ෂ අටකට වැඩි කාලයක් භාවිතා නොකර පැවතුණි.

(ආ) රු. 617,151 ක වටිනාකමින් යුත් වර්ග 35 කට අයත් විෂයයන් වර්ෂ එකේ සිට දහය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ගබඩාවල නිශ්කාර්යව පැවතුණි. මේ සම්බන්ධයෙන් මාගේ ඉකුත් වර්ෂය සඳහා වූ විගණන වාර්තාවෙන්ද අවධානයට යොමු කරන ලදී. කෙසේ වුවත් මෙම වත්කම් ප්‍රයෝජනයට ගැනීම සඳහා 2011 ජුනි 30 දක්වා විශ්වවිද්‍යාලය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) එකතුව රු. 200,305 ක් වූ වර්ග 10 කට අයත් ඉන්වෙන්ටරි විෂයයන් 5,258 ක් වර්ෂ අටකට වැඩි කාලයක් ගබඩාවල නිශ්කාර්යව පැවතුණි.

(ඈ) රු. 182,400 කට මිලදී ගත් වේලා සටහන් යන්ත්‍රයක් 2001 වර්ෂයේ සිට භාවිතා නොකර පැවතුණි.

(ඉ) රු. 2,137,500 කට මිලදී ගෙන තිබූ වානේ ඇඳන් 225 ක් වර්ෂ දෙකකට වැඩි කාලයක් භාවිතා නොකර පැවතුණි.

3.1.5 *හඳුනාගන්නා ලද පාඩු*

වටිනාකම රු. 161,633 ක් වූ පුස්තකාල පොත් නැතිවීම් සම්බන්ධයෙන් වූ පාඩු සමාලෝචිත වර්ෂය තුළ ලියා හැර තිබුණි.

3.1.6 *ව්‍යාපෘති ප්‍රමාදයන්*

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ :

(අ) 2008 වර්ෂය තුළදී විශ්වවිද්‍යාලයේ කාන්තා නේවාසිකාගාර සංකීර්ණය සඳහා අපවිත්‍ර ජලය බැහැර කිරීමේ පද්ධතියක් හඳුන්වාදීම සඳහා උපදේශක ගාස්තු ලෙස රු. 750,375 ක අත්තිකාරම් මුදලක් ජාතික ජලසම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයට ගෙවන ලදී. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වැඩ ආරම්භ කර නොතිබුණි.

(ආ) වෛද්‍ය පීඨයෙහි ශ්‍රවනාගාරයක් ඉදි කිරීම සඳහා 1999 සිට 2000 දක්වා වූ කාලය තුළ ඉදිකිරීම් සමාගමකට රු. 7,611,885 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද ඉදිකිරීම් කටයුතු මෙතෙක් සම්පූර්ණයෙන් නිම කර නොතිබුණි. මෙම අනවශ්‍ය ප්‍රමාදය හේතුකොටගෙන ඉදිකිරීම් පිරිවැය අති විශාල වශයෙන් වැඩිවීමට ඉඩ ඇති අතර, ඉදිකිරීමේ අරමුණු ද ඉටු වී නොතිබුණි. මීට අතිරේකව අභ්‍යන්තර නිර්මාණ වැඩ සඳහා 2005 සහ 2006 වර්ෂවලදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට රු. 13,000,000 ක් ගෙවා තිබුණු අතර, ඒවාද මෙතෙක් ආරම්භ කර හෝ නොතිබුණි.

මේ සම්බන්ධයෙන් 2010 ජූලි 29 වැනි දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පැවැති ප්‍රගති සමාලෝචන රැස්වීමේදී ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මන්දගාමී ප්‍රගතිය පිළිබඳව ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමාගේ විශේෂ අවධානයට යොමුවී තිබුණු අතර මෙම ව්‍යාපෘතිය නිම කිරීමට අවශ්‍ය පියවර ගෙන ඒ පිළිබඳ ප්‍රතිඵලය වාර්තා කරන ලෙස උපදෙස් ලබා දී තිබුණි. 2011 මාර්තු 14 වැනි දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී සීලිම්, විදුලි කාර්මික, වායුසමීකරණ සහ ආසන වැඩ මේ දක්වා ආරම්භ කර නොතිබුණු බව අනාවරණය විය. විශ්වවිද්‍යාලය විසින් රු. මිලියන 20 ක මුදලක් වැය කර තිබුණු නමුත් මෙහි ප්‍රතිඵලයක් ලෙස මෙම පහසුකම් තුළින් වර්ෂ දහයකට වැඩි කාලයක් තිස්සේ වෛද්‍ය පීඨයේ සිසුන්ට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

(ඈ) තිරුනල්වේලි ශිෂ්‍ය නේවාසිකාගාරයට මුදුන් ජල ටැංකියක් ඉදිකිරීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට අත්තිකාරම් ලෙස 1989 වර්ෂයේදී රු. 2,000,000 ක් ගෙවා තිබුණු නමුත් රු. 1,590,000 ක වටිනාකමින් යුත් වැඩ කොටස් පමණක් සම්පූර්ණ කර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් එම පීඨයේ ශිෂ්‍යයන් එහි බලපෑමට ලක් වී තිබුණි.

(ඈ) කොළඹ පිහිටි සමාගමකට රු. 1,485,208 ක මුදලක් සහ සීඩා (SIDA) තොරතුරු තාක්ෂණ ජාල ව්‍යාපෘතියෙන් තවත් රු. 10,171,618 ක මුදලක් පළාත් ප්‍රදේශ ජාල/පුළුල් ප්‍රදේශ ජාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා (LAN/WAN) එම සමාගමට විශ්වවිද්‍යාලය මගින් ගෙවා තිබුණි. එම ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තා විගණනයට ලබාගත නොහැකි විය. ව්‍යාපෘතිය 2005 මුල් භාගයේදී ආරම්භ කර තිබුණද 2011 ජුනි 30 දින වන විටත් එය අවසන් කර නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියෙන් බලාපොරොත්තුවූ අරමුණ ඉටුකරගෙන නොතිබුණි.

(ඉ) පම්පායිමාඩුහි වවුනියාව මණ්ඩපය සඳහා මුදුන් ජල ටැංකියක් (Overhead tank) හා භූගත ජල ටැංකියක් (Sump)ඉදිකිරීම සඳහා එවකට උතුරු නැගෙනහිර පළාත් සභාවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරුවරයාට 2004 දෙසැම්බර් 31, 2005 නොවැම්බර් 16 හා 2007 ඔක්තෝබර් 04 යන දිනවලදී පිළිවෙලින් රු.3,200,000 සහ 3,014,000 ක් සහ රු. 5,615,000 ක් වශයෙන් අත්තිකාරම් තුනක් මුදාහැර තිබුණි.

භූගත ජල ටැංකිය ඉදි කිරීම් නිම කර තිබුණි. කෙසේ වුවද, මුදුල් ජල ටැංකිය සහ ඉතිරි වැඩ කොටස් නිම කර නොතිබුණි. මේ අතරතුර ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් කොන්ත්‍රාත්තුව නවත්වා දමා තිබුණි. වැඩ නැවැත්වීම දක්වා කොන්ත්‍රාත්කරුට රු. 2,439,956 ක් ගෙවා තිබුණි. ඉතිරි වැඩ සඳහා වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු සමග රු. 5,615,000 ක වටිනාකමකින් යුත් නව ගිවිසුමක් අත්සන් කර තිබුණි. එහෙත් 2011 ජුනි 30 දක්වා වැඩ සම්පූර්ණ කර නොතිබුණි.

3.2 *මානව සම්පත් කළමනාකරණය*

නියමිත බඳවා ගැනීමේ පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව විශ්වවිද්‍යාලයේ දෙපාර්තමේන්තු අංශ ප්‍රධානීන්ගේ ඉල්ලීම මත බොහෝ අවස්ථාවලදී තාවකාලික කථිකාචාර්යවරුන්, උපදේශකයින් (Tutors) සහ ප්‍රදර්ශකයින් පත් කර තිබුණි.

3.3 *පාඨමාලා සහ විභාග*

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ :

(අ) විශ්වවිද්‍යාලයේ පාඨමාලා 22 ක් වෙනුවෙන් ලියාපදිංචි වී සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 5,395 ක් විය. සමාලෝචිත වර්ෂය තුළදී දරන ලද මුළු පුනරාවර්තන වියදම රු. 487,578,520 ක් විය. එක් ශිෂ්‍යයකු සඳහා සමාලෝචිත වර්ෂයේ සාමාන්‍ය පුනරාවර්තන පිරිවැය රු. 90,370 ක් විය.

(ආ) විශ්ව විද්‍යාලයේ එක් එක් පීඨය යටතේ විවිධ පාඨමාලා සඳහා විභාග පවත්වන දිනයන් හා විභාග ප්‍රතිඵල නිකුත් කරන ඉලක්ක දිනයන් තීරණය කර නොතිබුණි. 2009 සහ 2010 වර්ෂවලදී පීඨ කිහිපයක පවත්වා තිබුණු විභාගවල ප්‍රතිඵල නිකුත් කිරීමට දීර්ඝ ප්‍රමාදයක් සිදුවී තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය. 1995 ජූලි 14 දිනැති අංක 636 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව විභාගය අවසන් වී මාස තුනක් ඇතුළත ප්‍රතිඵල නිකුත් කළ යුතුය. එහෙත් මාස 04 සිට 14 දක්වා කාල පරාසයක් ප්‍රතිඵල නිකුත් කිරීමට ප්‍රමාද වී තිබුණි.

3.4 *අයවැය ලේඛනමය පාලනය*

අයවැය ගත හා තථ්‍ය සංඛ්‍යා අතර, සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව දක්නට ලැබුණි.

**4. පද්ධති හා පාලන**

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මගින් විශ්වවිද්‍යාලයේ උප කුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය :

(අ) කොන්ත්‍රාත් පරිපාලනය ;
(ආ) පුස්තකාල පරිපාලනය ;
(ඇ) වත්කම් කළමනාකරණය ;
(ඈ) නිශ්චිත අරමුදල් උපයෝජනය ;
(ඉ) ව්‍යාපෘති ප්‍රමාදවීම් ;
(ඊ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ;
(උ) මානව සම්පත් කළමනාකරණය ;
(ඌ) අයවැය.

එච්. ඒ. එස්. සමරවීර,
වැඩබලන විගණකාධිපති.

**යාපනය විශ්වවිද්‍යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ ගිණුම්වලට අදාළ විගණකාධිපති වාර්තාව පිළිබඳව යාපනය විශ්වවිද්‍යාලයේ පාලන අධිකාරියේ නිරීක්ෂණ**

2.2.2 *ගණකාධිකරණ අඩුපාඩු*

(අ) වාර්ෂික දායක මුදල් ගෙවීමෙන් සඟරා මිලදී ගැනේ. බොහෝ විට ලබන වසරේදී ලැබෙන සඟරා සඳහා මෙම වසරේ වෙන් කිරීම් වලින් ගෙවනු ලැබේ. මෙය දිගු කාලයක සිට සිදුවන්නක් වන අතර කාර්තුවකට වරක් ලැබුණ සඟරා පිළිබඳව වාර්තාවක් මුල්‍යාධිකාරීවෙත පුස්තකාලයෙන් එවනු ලැබේ. පොත් ලැබීම් අපේක්ෂා කරන අතර ලැබිය යුතු සඟරා ශේෂයෙන් අඩු වී තිබේ. (විශ්වවිද්‍යාලයට ලැබී නොමැති රුපියල් 5,40,886.64 ක් වටිනා ජනල් සහ සඟරා 49 ක් වැරදීමකින් පොත්පත් හා සඟරා ගිණුමේ ඇතුලත් කර ඇත.)

(ආ) නොනිමි වැඩ 2011 වර්ෂයේදී ඉඩම් හා ගොඩනැගිලි ගිණුමට මාරු කිරීමට කටයුතු කර ඇත.

(ඇ) 2011 වර්ෂය තුළදී අනුකූල වීමට අවධානය යොමු කෙරේ.

(ඈ) ගිණුම්වලට ගෙන ඒමට කටයුතු යොදා ඇත.

(ඉ) ගෙවිය යුතු බැඳුම්කර හා වගකීම් ගිණුමක් ඇති කිරීමට කටයුතු යොදා ඇත.

2.2.3 *ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්*

(අ) සුදුසු පරිදි ශේෂ පියවීමට හෝ ආදායම් වලට බැරකිරීමට කටයුතු යොදා ඇත.

(ආ) (i) විවිධ ණයගැතියෝ වි. වි. අ. අ. ණය ආදී - ණය මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කර ඇත.

(ii) ගොඩනැගිලි අත්තිකාරම්වල ශේෂ මුදල් - ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් අවශ්‍යකරන ලියවිලි ලබා ගනිමින් නොපියවූ අත්තිකාරම් පියවීමට කටයුතු සිදුකර ඇත.

(iii) සැපයුම් අත්තිකාරම් ශේෂ මුදල සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

(iv) කාර්ය මණ්ඩල ණය 2010.12.31 දිනට ශේෂය රුපියල් 99,635,946 ක් විය. මෙම ශේෂයෙන් රුපියල් 1,255,675 ක් වර්ෂ හයකටත් වඩා වැඩි ණය වේ. ණය මුදල ආපසු අයකර ගැනීමට කටයුතු යොදා ඇත.

(ඇ) නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත.

(ඈ) (i) 2010 වර්ෂය තුළදී බැඳුම්කරය හා ගිවිසුම කඩකරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් රුපියල් 55,27,693.44 ක් පියවා ගෙන ඇති අතර ඔවුන්ගේ එකඟතාවය පරිදි තවත් රුපියල් 71,09,489.82 ක් අර්ථසාධක අරමුදලෙන් පියවා ගැනීමට අනුමැතිය ලබා ගෙන ඇති මෙයට අදාල විස්තරවල සාරාංශය පහත වගුවේ දක්වා ඇත.

| *වර්ෂය* | *ගෙවීම් මුදල් චෙක්පත් වටිනාකම* (රු) | *වි. අ අරමුදලින් පියවීම* (රු) | *පාරිතෝෂික වලින් පියවීම* (රු) | *විවිඅ අරමුදලින් පියවීම් කිරීමට අනුමැතිය ලත් (විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂමෙන් දැනට ප්‍රේශණය කර නොමැති* (රු) | *මුළුමුදල* (රු) |
|---|---|---|---|---|---|
| 2010 | 1,748,875.64 | 439,819.13 | 47,897.49 | 4,614,617.90 | 6,887,210.16 |
| 2011 (අද දිනට) | 748,836.54 | 2,455,475.64 | 45,790.00 | 2,494,871.92 | 5,744,974.10 |
| මුළු මුදල | **2,497,712.18** | **2,895,294.77** | **93,687.49** | **7,109,489.82** | **12,637,184.26** |

(ii) තවද 2010 වර්ෂයට පෙර රුපියල් 45,99,906.72 ක් අර්ථසාධක අරමුදලෙන් පියවා ගැනීමට අනුමැතිය ලැබී තිබුණත් තවමත් එම මුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ප්‍රේශණය කර නොමැත. එම මුදල ප්‍රේෂණය කර ගැනීමට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ප්‍රේශණය ඉල්ලුම් කර ඇත.

(iii) අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දහතුන් දෙනෙකු විසින් ඇප වශයෙන් තබා ඇති රුපියල් 21,868,826.40 ක් වටිනා උකස් දේපල විශ්වවිද්‍යාලය වෙත ලබාගැනීමට කටයුතු සිදුකරමින් පවතී.

(iv) තවද රුපියල් 22,560,755.67 ක මුදල අය කර ගැනීම ගෙවීම් පැහැර හැර හතලිස්පස් දෙනෙකුට සහ ඔවුන්ගේ ඇපකරුවන් වෙත නීතිපති දෙපාර්තමේන්තුව විසින් ඉල්ලීම් ලිපි යවා ඇත. නීතිමය පියවර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු අඛණ්ඩව සිදුකරන මෙන් නීතිපති දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත.

(v) ලැයිස්තුවේ සඳහන් කර ඇති අධ්‍යයන කාර්ය මණ්ඩල සේවයේ පුනර්යුක්ත කර ඇති අතර කාර්ය මණ්ඩලයේ හතර දෙනෙකු ඔවුන්ගේ වගකීම් පියවා ඇත. ලැයිස්තුව යාවත්කාලීන කිරීමට පියවර ගනිමින් සිටී.

2.2.5 *පහත දැක්වෙන ආකාරයට කටයුතු කර ඇත.*

| | *බලපෑම් සිදු වී ඇති ගිණුම්වල ඇති අයිතම පිළිබඳ විස්තර* | *2010 දෙසැම්බර් 31 වැනි දිනට ශේෂය (රු)* | *ලබාගත නොහැකි සාක්ෂි* | *ගෙන ඇති පියවර* |
|---|---|---|---|---|
| **යාපනය විශ්වවිද්‍යාලය** | | | | |
| (i) | ඉඩම් හා ගොඩනැගිලි | 856,347,816.00 | තක්සේරුව හා සමීක්ෂණ මණ්ඩලයේ වාර්තා | වාර්ෂික සමීක්ෂණ ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත. |
| (ii) | ඉඩම් | 28,994,671.00 | ස්ථාවර වත්කම් පිළිබඳ වටිනාකම පෙන්වන සත්‍යාපන වාර්තා | වාර්ෂික සමීක්ෂණ ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත. |
| (iii) | පුස්තකාල පොත් හා සඟරා | 208,445,633.00 | එම | එම |
| (iv) | මෝටර් රථ | 21,435,415.00 | එම | එම |
| (v) | ලෝගු | 2,986,215.00 | එම | එම |
| (vi) | කම්හල් හා යන්ත්‍රසූත්‍ර | 2,132,537.00 | එම | එම |
| (vii) | දුරකථන හුවමාරුව | 3,566,362.00 | එම | එම |
| (viii) | සුළු මුදල් අග්‍රිමය | 2,000.00 | සත්‍යාපන වාර්තාව | ගොනුවෙන් ලබාගත හැක |
| (ix) | අත ඇති මුදල් | 16,088.00 | එම | එම |
| (x) | දෙපාර්තමේන්තු වල ඇති තොග | 302,462.00 | එම | එම |
| (xi) | අනෙකුත් පුනරාවර්තන වියදම් (උපචිත) | 633,008.00 | විස්තර උපලේඛනය | එම |
| (xii) | තැපැල් අග්‍රිමය | 10,000.00 | සත්‍යාපන වාර්තාව | එම |
| (xiii) | අවලංගු කරන ලද චෙක්පත් | 21,295.00 | චෙක් පිළිගත් | ලබාගත හැක |
| (xiv) | නොනිමි වැඩ | 59,408,750.00 | විස්තර උපලේඛනය | එම |
| (xv) | වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු මුදල් | 38,021,025.00 | විස්තර උපලේඛනය | අවසාන ගිණුම්වලින් ලබාගත හැක |
| (xvi) | ගෙවිය යුතු මුදල් අනෙකුත් | 8,706,133.00 | විස්තර උපලේඛනය | අවසාන ගිණුම්වලින් ලබාගත හැක |
| (xvii) | තැන්පතු | 4,979,843.00 | උපලේඛනය | උපලේඛනවලින් ලබාගත හැක |
| (xviii) | වාහන ඉන්ධන වියදම් | 21,475,414.00 | ධාවන සටහන රථවාහන ලේඛනය | ලබා ගත හැක |
| (ix) | ඉතුරුම් ගිණුම් බැඳුම්කර වගකීම් | | | |
| (xx) | කලා | 284,049.00 | තහවුරු කිරීමේ සහතික පත් | බැංකු ඉතිරුම් ගිණුම් පාස්පොත ලබාගත හැක |
| (xxi) | වෛද්‍ය | 116,195.00 | තහවුරු කිරීමේ සහතික පත් | එම |
| (xxii) | විභාග | 9,707.00 | තහවුරු කිරීමේ සහතිකපත් | එම |
| (xxiii) | විද්‍යා | 996,867.00 | තහවුරු කිරීමේ සහතිකපත් | එම |
| (xxiv) | පුස්තකල | 29,738.00 | තහවුරු කිරීමේ සහතිකපත් | එම |
| (xxv) | බාහිර | 29,738.00 | තහවුරු කිරීමේ සහතික පත් | එම |
| (xxvi) | වෛද්‍ය මධ්‍යස්ථාන | 178,00 | තහවුරු කිරීමේ සහතික පත් | එම |
| (xxvii) | පරිපාලන | 7,652.00 | තහවුරු කිරීමේ සහතික පත් | එම |
| (xxviii) | කෘෂි විද්‍යා | 370.00 | තහවුරු කිරීමේ සහතික පත් | එම |
| (xxix) | පොදු සංචිත වලින් අරමුදල් | 119,000,000.00 | අනුමත ජනල් | ජනල් ලබාගත හැක |
| (xxx) | පෙර වර්ෂයට කල ගැලපීම් | 128,271.00 | ජනල් | මුල්‍ය කමිටුවෙහි සහ කවුන්සලයේ අනුමැතිය ලබාගත හැක |

| බලපෑම් සිදු වී ඇති ගිණුම්වල ඇති අයිතම පිළිබඳ විස්තර | | 2010 දෙසැම්බර් 31 රු. | ලබාගත නොහැකි වන දිනට ශේෂය | ගෙන ඇති පියවර සාක්ෂි රු. |
|---|---|---|---|---|
| (xxxi) | අත්හිටවූ අරමුදලට මාරුකිරීම් | 74,906,250.00 | මණ්ඩල අනුමැතිය ජනල් | ගිණුම්කරණ මූලධර්මවලට අනුව මූල්‍ය ප්‍රකාශනවල පෙන්වන ශුද්ධ අගය මාරුකර ඇති නිසා කවුන්සිලයේ අනුමැතිය හෝ ජනල් සටහන් අවශ්‍ය නොවේ |
| (xxxii) | සැපයුම් | 29,783,090.00 | තොග පාලන ගිණුම් | ලබාගත හැක |
| (xxxiv) | අතිකාල සහ නිවාඩු දීමනා | 15,270,230.00 | ශාඛාවේ ප්‍රධානියාගේ සහතිකය කරන ලද වැඩවල විස්තර | ලබාගත හැක |
| (xxxv) | බැඳුම්කර වගකීම් | 112,155,077.00 | කාල විශ්ලේෂනය | උපලේඛණයෙන් ලබාගත හැක |
| (xxxvi) | නොනිමි වැඩ | 49,120,000.00 | විස්තර | ලබාගත හැක |
| (xxxvii) | කාර්ය මණ්ඩල ණය | 795,540.00 | පාලන ගිණුම් ණය පියවීමේ ලේඛන ණයගැතියන්ගේ හා ණයහිමියන්ගේ ලේඛනය | ලබාගත හැක පාලන ගිණුම් ණය පියවීමේ ලේඛන (IPR කාඩ්පත්) |
| (xxxviii) | ආපදා ණය | 85,670,850.00 | එම | එම |
| (xxxix) | මෝටර් සයිකල් ණය | 4,799,642.00 | එම | එම |
| (xl) | දෙවසර ණය | 12,475.00 | එම | එම |
| (xLi) | පරිගණක ණය | 34,000.00 | එම | එම |
| (xlii) | ආනයන අත්තිකාරම් රසායනික ද්‍රව්‍ය | 1,452,391.00 | ගොනුව සහ එකඟතාවය | ලබාගත හැක |
| (xLiii) | ආනයන | 1,689,521.00 | ගොනුව සහ එකඟතාවය | එම |
| (xliv) | ලද වට්ටම් | 342,541.00 | ජනල් | වවුචර් වලින් ලබාගත හැක |
| (xLv) | පුනරුත්ථාපන නොනිමි වැඩ | 10,288,750.00 | විස්තර | ලබාගත හැක |

3.1.3 (අ) ඇතැම් මුදල් ගෙවිය යුතු අධ්‍යන පාඨමාලාවල එකතුව හේතුවෙන් මූල්‍ය ශේෂයක් පවතී. මුදල් ගෙවිය යුතු අධ්‍යයන පාඨමාලා නියම කර ඇති කාලයක් තුළ පැවැත්වෙන පාඨමාලාවේ බැඳුම්කර වගකීම හා ප්‍රදාන අරමුදල මඟින් ලැබී ඇති මුදල්ද ශේෂයේ ඇතුලත් වී ඇති අතර මේවා වරින්වර ස්ථිර තැන්පතුවලට මාරුකර තිබේ. අවම මුදල් ශේෂයක් තබා ගැනීමට අවධානය යොමු කර තිබේ.

(ආ) විශ්වවිද්‍යාලයේ අමුත්තන්ගේ නිවාසය වායුසමීකරණය හා වෙනත් අවම පහසුකම්වලින් පමණක් සමන්විතය. මහාචාර්යවරු සහ වෙනත් නිලධාරීන් වර්තමාන තත්වය මත මෙහි නැවතී සිටීමට අකමැතිය. මෙහි පහසුකම් වැඩි දියුණු කිරීමට පියවර ගනු ලැබේ.

(ඇ) විශේෂයෙන්ම දුරගමන් අවස්ථාවලදී මෙම බස්රථ භාවිතා කළ නොහැකි අතර එවැනි අවස්ථාවලදී වෑන් රථ භාවිතා කිරීමට සිදුවේ.

3.1.4 *වත්කම් කළමණාකරණය* :

(අ) එක් ස්කූටරයක් අලුත්වැඩියා කර භාවිතා කරන අතර වාර්ෂිකව පවත්වනු ලබන සමීක්ෂණ මණ්ඩලයන්හි අනුමැතිය අනුව කටයුතු සිදුකිරීමට නියමිතය.

(ආ) යල්පැන ගිය සහ පරිහානියට පත් වූ අයිතම හඳුනා ගැනීමට කටයුතු සිදුකර ඇත. අනෙකුත් ඒවා නියමිත පරිදි පාවිච්චියට ගැනීමට හැකිවේ.

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නව චක්‍රලේඛයන්ට අනුව ක්‍රමානුකූලව ඇඟිලි සලකුණු යන්ත්‍ර හඳුන්වා දීමට කටයුතු සිදු කර ඇත.

3.1.6 *ව්‍යාපෘති ප්‍රමාදයන්* :

(අ) ජාතික ජලසම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය විසින් සමහර ලේඛන ලබාදීමට අසමත් වූ නිසා මෙම ප්‍රමාදය සිදුවිය. දැනට ජාතික ජලසම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය සමඟ වැඩකටයුතු කර ගැනීමට අවධානය යොමුකර ඇත. ඉතා කඩිනමින් මෙම වැඩ කටයුතු ආරම්භ කෙරෙනු ඇත.

(ආ) ව්‍යුහාත්මක වැඩකටයුතු නිමකර ඇත. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මගින් අභ්‍යන්තර අලංකරණ වැඩ විශේෂඥයෙකුගේ මාර්ගයෙන් සිදුකරමින් පවතී.

(ඇ) නැවත ආරම්භ කිරීමට වැඩකටයුතු සිදුකරමින් පවතී.

(ඈ) 2011.06.15 වැනි දින වැඩකටයුතු නිමකර ඇත.

(ඉ) නොවැළැක්විය හැකි තත්වයක් මත කොන්ත්‍රාත්කරු වෙනස් කරනු ලැබීය. දැනට වැඩ කටයුතු නිම කර ඇත.

3.2 *මානව සම්පත් කළමනාකරණය* :

බඳවා ගැනීමේ පටිපාටියට අනුකූල නොවන පරිදි 2010 වර්ෂයේදී තාවකාලික පත්වීම් සිදු කර නැත.

3.3 *පාඨමාලා සහ විභාග*

චක්‍රලේඛ හා සම්පත් ලබාගැනීම මත පදනම්ව නියමිත කාලයන්හිදී ප්‍රතිඵල නිකුත් කිරීමට පීඨාධිපතිවරුන්ගෙන් ඉල්ලා ඇත.

3.5 *අයවැය පාලනය*

විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශයන්ට අවධානය යොමු කෙරේ. විචලතාවයන් අවම කිරීමට පීඨවලට දැනුම් දී තිබේ.

**4. පද්ධති හා පාලනය**

සුදුසු පද්ධති හා පාලනයන් සැලසුම්කර තිබේ. කාර්ය මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය මෙහෙයවමින් මෙම පද්ධති සහ අවශ්‍යතාවයන් දැඩිලෙස අනුගමනය කිරීමට අංශාධිපතීන් දැනුවත් කර ඇත.

මුල්‍යාධිකාරී විසින් සම්පාදිතය.

10-148

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2013.07.04 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් බී. බී. රණසිංහ විසින් සහතික කරන ලද 2011.08.16 දිනැති අංක 6428 දරන උකස් බැඳුම්කරය අනුව 2013.06.10 දින තෙක් මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් හැට එක් ලක්ෂ පනස් එක් දහස් තුන්සිය විසි එකයි ශත හැත්තෑ තුනක (රු.6,151,321.73) මුදල සමග රුපියල් පනස් හය ලක්ෂ පනස් පන් දහස් එකසිය අසූ හයයි ශත පනස් නවයක (රු.56,55,186.59) මුදල මත වසරකට සියයට දහ තුනයි දශම පහයි බිංදුව (13.50%) බැගින් පොළියක් 2013.06.11 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් රාජගිරිය, ඔබේසේකරපුර, ගෝතමී පෙදෙසේ, අංක 133/16/A හි පදිංචි සේනක කුමාරසිංහ මහතා සහ බුලත්සිංහල ආරච්චිගේ දර්ශනී විජේසේකර මහත්මිය යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් බී. බී. රණසිංහ විසින් සහතික කරන ලද 2011.08.16 දිනැති එකී අංක 6428 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් හැට එක් ලක්ෂ පනස් එක් දහස් තුන්සිය විසි එකයි ශත හැත්තෑ තුනක (රු.61,51,321.73) මුදල සමග 2013.06.11 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළියද, ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි, ටී. ඇන්ඩ් එච් ඔක්ෂන්හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතාට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥා පනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළකිරීමට ලංකා බැංකුවේ, බොරැල්ල අධිශ්‍රේණි ශාඛාවේ, ශාඛා කළමනාකරුහට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලයේ, පල්ලේපත්තුවේ, කෝට්ටේ නගර සභා සීමාවේ, ඔබේසේකර පුරයෙහි වැලිකඩ පිහිටි රාජගිරිය, ගෝතමී පෙදෙසේ අංක 133/16/A වරිපනම් අංක දරන දන්වැටියමුල්ල කුඹුර නොහොත් පාදිලිනෝනගේ කුඹුර නොහොත් අගලේම්මුල කුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. එස්. අලහකෝන් විසින් සාදන ලද 2003 ජනවාරි 07 දිනැති අංක 2335 දරන පිඹුරෙහි ලොට් 16Q ලෙස දක්වා සීමා නීර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 16, උතුරට පාර (පිඹුරු අංක 410A හි ලොට් 30) ද, නැගෙනහිරට පිඹුරු අංක 410A හි ලොට් 15 ද, දකුණට කිඳ ඇළද, බස්නාහිරට ලොට් 16ද මායිම්ව අංක 2335 දරන පිඹුරට අනුව පර්චස් දහසයක (අ. 0, රූ.0, පර්. 16) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි වැවෙන ගහකොළ සහ ඇති ගොඩනැගිලි ආදියද සමග වේ.

එනම් ලොට් 16Q ලෙස සටහන් කර ඇති එකී බෙදූ ඉඩම් කැබැල්ල පහත දැක්වෙන ඉඩමෙන් බෙදා සීමා වෙන් කරන ලද කොටසකි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේපත්තුවේ, කෝට්ටේ නගර සභා සීමාවේ, ඔබේසේකර පුරයෙහි, වැලිකඩ පිහිටි රාජගිරිය, ගෝතමී පෙදෙසේ අංක 133/16/A වරිපනම් අංක දරන දන්වැටියමුල්ල කුඹුර නොහොත් පාදිලිනෝනගේ කුඹුර නොහොත් අගලෙමුල්ල කුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සී. සී. වික්‍රමසිංහ විසින් සාදන ලද 1966 සැප්තැම්බර් 25 දිනැති අංක 410A දරන පිඹුරෙහි ලොට් 16 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 16 උතුරට ලොට් 30 (අඩි 30 පළල පාරට වෙන් කළ කොටස) ද, නැගෙනහිරට ලොට් 15 ද, දකුණට කිඳ ඇළ ද, බස්නාහිරට ලොට් 17ද, මායිම්ව එකී අංක 410A දරන පිඹුරට අනුව පර්චස් දහසයයි දශම දෙකක (අ. 0, රූ.0, පර්. 16.2) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර එහි ඇති හා වැඩෙන ගොඩනැගිලි හා ගහකොළ සමග යුක්ත වේ. මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M1520/31 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. එම්. ආර්. ඩී. සුබසිංහ,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
බොරැල්ල අධිශ්‍රේණි ශාඛාව.

10-146

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම් දීම

2013.08.22 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී. :

1. ප්‍රසිද්ධ නොතාරිස් ඊ. කේ. එච්. එම්. කරුණාතිලක විසින් සහතික කරන ලද 2012.09.06 දිනැති අංක 3064 දරන උකස් බැඳුම්කරය අනුව 2013.06.30 දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් පනස් හය ලක්ෂ පන් දහස් හත්සිය තුනයි ශත හැත්තෑ හතක (රු5,605,703.77) මුදල සමග රුපියල් මිලියන පහක (රු.5,000,000) මුදල මත වසරකට සියයට විසි තුනයි දශම පහක් (23.5%) බැගින් පොලියක් 2013.07.01 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් මණ්ඩාවල, පුංචි මණ්ඩාවල, පොල්ගස්ලන්ද පාරේ, අංක 284/8හි පදිංචි මහේෂ් ප්‍රසන්න පිංදෙනිය මහතා සහ මාදම්පගේ දොන් දූල් ශ්‍රියානි මාදම්පගේ මහත්මිය යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් ඊ. කේ. එච්. එම්. කරුණාරත්න විසින් සහතික කරන ලද හා 2012.09.26 දිනැති එකී අංක 3064 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් පනස් හය ලක්ෂ පන් දහස් හත්සිය තුනයි ශත හැත්තෑ හතක (රු.5,605,703.77) මුදල සමග 2013.07.01 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 05, හැව්ලොක් පාරේ, අංක 290 හි වෙන්දේසිකාර ෂොක්මන් හා සමරවික්‍රම මහත්වරුන්හට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥා පනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළකිරීමට ලංකා බැංකුවේ, හංවැල්ල ශාඛාවේ කළමනාකරුට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ, ගඟබඩ පත්තුවේ, 410/CA වහර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කිරිඳිවැල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දොම්පෙ ප්‍රාදේශීය සභා සීමාව තුළ ලුණු ගම පිහිටි රදවලලන්ද නමැති ඉඩමට එහි ඇති ගහකොළ, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේද ඇතුළත්ව බලයලත් මිනින්දෝරු කේ. ටී. පී. ආර්. අනුගම්මන විසින් සාදන ලද 1999 අප්‍රේල් 01 දිනැති අංක 91A/1999 දරන පිඹුරෙහි ලොට් 4 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 4 උතුරට ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට ලොට් 5 ද, දකුණට ලොට් 6 ද, බස්නාහිරට ලොට් 3 ද, මායිම්ව අංක 91A/1999 දරන පිඹුරට අනුව පර්චස් දහසයක (අ. 0, රූ. 0, පර්. 16) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D451/262 හි ලියාපදිංචි කර ඇත.

2. එකී ලුනුගම පිහිටි "රදාවලලන්ද" නමැති ඉඩමේ, එහි ඇති ගහකොළ ගොඩනැගිල්ල සහ වෙනත් සියලු දේ ඇතුළත්ව අංක 91A/1999 දරන පිඹුරෙහි ලොට් 5 ලෙස දක්වා සීමා නිර්ණය කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 5 උතුරට ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට පිඹුරු අංක 775 හි ලොට් Aද, දකුණට ලොට් 6 ද, බස්නාහිරට ලොට් 4 ද මායිම්ව එකී අංක 91A/1999 දරන පිඹුරට අනුව පර්චස් දහසයකින් (අ. 0, රූ. 0, පර්. 16) යුක්ත වන අතර මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D451/262 හි ලියාපදිංචි කර ඇත.

මේ සමග මෙය අංක 91A/1999 දරන පිඹුරෙහි ලොට් 3 ලෙස දක්වා ඇති පාරට වෙන් කළ කොටස මතින් හා ඒ දිගට මාර්ග අයිතිය ද ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. එම්. සරත් කුමාර,
ශාඛා කළමනාකරු.

2013 සැප්තැම්බර් මස 03 වැනි දින,
ලංකා බැංකුව,
හංවැල්ල,

10-123

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම.

2013.03.21 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී. :

(1) ප්‍රසිද්ධ නොතාරිස් එන්. පී. ජී. චන්ද්‍රිකා විසින් සහතික කරන ලද 2007.12.06 දිනැති අංක 1720 දරන උකස් බැඳුම්කරය අනුව මුල්

මුදල හා 2013.02.01 දින තෙක් මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් එක් කෝටි දෙලක්ෂ විසිතුන් දහස් එකසිය තිස් පහයි ශත හැට නවයක් (රු.10,223,135.69) සහ රුපියල් හතලිස් හත් ලක්ෂ දහ නව දහස් අසූ හතරයි ශත තිහක (රු.4,719,084.30) මුදල සමග රුපියල් හැට දෙලක්ෂ අනූ හතර දහස් දෙසීය හැට හතයි ශත පනස් පහක (රු.6,294,267.55) ක මුදලක් මත වසරකට සියයට දහ නවයයි දශම පහක් (19.5%) බැගින් සහ රුපියල් තිස් දෙලක්ෂ හැට හය දහස් හයසිය හැටක (රු.3,266,660) ක මුදලක් මත වසරකට සියයට දහ නවයයි දශම පහ (19.5%) බැගින් පොලියක් 2013.02.02 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් කොළඹ 08, කොටා පාරේ, බෙල්කම් පෙදෙසෙහි, අංක 2/9 හි පදිංචි අජන්තා මල්කාන්ති විජේසේකර මහත්මියගෙන් සහ කාංචන චෝදාත විජේසේකර මහතාගෙන් පිළිවෙලින් අයවිය යුතුව ඇත.

(2) එකී අංක 1720 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් එක් කෝටි දෙලක්ෂ විසිතුන් දහස් එකසිය තිස් පහයි ශත හැට නවයක් (රු.10,223,135.69) මුදල සමග රුපියල් හතලිස් හත් ලක්ෂ දහ නව දහස් අසූ හතරයි ශත තිහක (රු.4,719,084.30) 2013.02.02 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මාතර, කොටුව, විල්ෆ්‍රඩ් ගුණසේකර මාවතේ, අංක 39 හි පදිංචි වෙන්දේසිකාර එම්. එච්. පද්මානන්ද සිරිවර්ධන මහතාට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥා පනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම් පළ කිරීමට ලංකා බැංකුව, දෙවිනුවර ශාඛා කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### *උපලේඛනය*

1. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර තුළ, මාතර මහ නගර සභා සීමාව තුළ මාතර කොටුවේ අංක 416C දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කොටුව, විල්ෆ්‍රඩ් ගුණසේකර මාවතේ පිහිටි කොම්පැන්යේ ලිඳගාවවත්ත නොහොත් කොහොඹගහවත්ත නැමති, බර්ටන් හවුස් ලෙස ද ප්‍රසිද්ධ ඉඩම් එහි ඇති සියලු ගොඩනැගිලි ද, ඇතුළුව වරිපනම් අංක 15 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. පී. සුනිල් විසින් සාදන ලද 2003 සැප්තැම්බර් 12 දිනැති අංක 778 දරන පිඹුරෙහි ලොට් අංක A ලෙස දක්වා සීමා නිර්ණය කර ඇති ලොට් A උතුරට විල්ෆ්‍රඩ් ගුණසේකර මාවත ද, නැගෙනහිරට වරිපනම් අංක 06 (පරණ අංක 106) දරන ස්වස්තික නැමති පරිශ්‍රය ද, දකුණට සී. එස්. ජයවර්ධන විසින් සාදන ලද අංක 1441 දරන පිඹුරෙහි ඇති එම ඉඩමේම ලොට් 1 ද, බස්නාහිරට වරිපනම් අංක 103 දරන කොහොඹගහවත්තේ කොටසක් ද මායිම්ව එකී අංක 778 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසි හතක (අ. 0, රූ. 0, පර්. 27) බිම් ප්‍රමාණයකින් යුක්ත ඉඩමේ බිම සහ එහි පිහිටි සියලු ගහකොළ සහ ගොඩනැගිලි ද වේ. මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A/456/28 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. එම්. ආරියවංශ,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
දෙවිනුවර.

10-124

## පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - පරණ යොන් වීදිය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු විසින් ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ගනුදෙනුකරුගේ නම : සුප්පයියා සුරේෂ් සහ පෙරියසාමි රමේෂ්
ශාඛාව : පරණ යොන් වීදිය

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2013.07.31 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම්, මැග්නට් ස්ට්‍රීල්ස් යන නාමය හා විලාසය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන ඉහත කී සුප්පයියා සුරේෂ් යන අය බන්ධනදායී සහ උකස්කරු වශයෙන්ද, පෙරියසාමි රමේෂ් යන අය බන්ධනදායී වශයෙන් ද කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ආර්. හේවාතන්ත්‍රී විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2012.01.27 දිනැති අංක 2291 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය මත ගෙවිය යුතු වූ මුදල් ගෙවීම් පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 2291 දරන උකස් බැඳුම්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂ 2013.06.30 දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් හැත්තෑ එක් ලක්ෂ අට දහස් හයසිය හැට නවයයි ශත හතලිස් හය (රු. 7,108,669.46) ක මුදල සහ රුපියල් පනස් හත් ලක්ෂ හැට දහස (රු.5,760,000,00)ක මුදල මත වර්ෂ 2013.07.01 වැනි දින සිට එක් වර්ෂයකට සියයට 26% ක ප්‍රතිශතය මත පොලිය ද, පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතු සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත් –

එකී අංක 2291 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් හැත්තෑ එක් ලක්ෂ අට දහස් හයසිය හැට නවයයි ශත හතලිස් හය (රු.7,108,669,46) ක මුදල ඉහතකී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද ගාස්තු ද අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තාවූ බැංකුව වෙත උකස්කර ඇති දේපල, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට, කෝට්ටේ, බැද්දගාන පාරේ, අංක 134 දරන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකාර පී. කේ. ඒ. සේනාපති වෙත එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

### *උපලේඛනය*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, රාගම් පත්තුව, වත්තල මාබෝලේ නගර සභා සීමාව ඇතුළත වත්තල, හේකිත්ත පාර, 03 වන පටුමගේ පිහිටි වරිපනම් අංක 36/6, 36/6ඒ, 36/6බී සහ 36/6 සී දරන කන්දගේවත්ත සහ බොළඳපතිරගේවත්ත සහ කුඹුර යනුවෙන් හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු ගාමිණී බී. දොඩන්වෙල විසින් සාදන ලද වර්ෂ 2010 ක් වූ අගෝස්තු මස 16 වැනි දිනැති අංක 8030 දරන

පිඹුරේ ලොට් 1 වශයෙන් සලකුණු කර දැක්වෙන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස. එකී ලොට් 1 කැබැල්ලට, උතුරට කන්දෙවත්ත පාර වරිපනම් අංක 50/46, 50/43 සහ 50/44 දරන පරිශ්‍රයන් ද, නැගෙනහිරට කන්දෙවත්ත පාර වරිපනම් අංක 50/43 සහ 50/44 දරන පරිශ්‍ර, මීගමුව පාර වරිපනම් අංක 252/4 සහ 243/3 දරන පරිශ්‍රයන් ද සහ හේකිත්ත පාර වරිපනම් අංක 237/6 දරන පරිශ්‍රය ද, දකුණට මීගමුව පාර වරිපනම් අංක 251/4 සහ 243/3 දරන පරිශ්‍ර, හේකිත්ත පාර වරිපනම් අංක 237/6 දරන පරිශ්‍රය සහ අඩි 12 ක් පළල මාර්ගය (බලයලත් මිනින්දෝරු එස්. සමරවික්‍රම විසින් සාදන ලද වර්ෂ 1999 ක් වූ සැප්තැම්බර් මස 05 වන දිනැති අංක 189/1999 පිඹුරේ ලොට් 1ඒ සහ ලොට් 1 බී කැබැල්ලේ කොටසක්) සහ බස්නාහිරට අඩි 12 ක් පළල මාර්ගය (බලයලත් මිනින්දෝරු එස්. සමරවික්‍රම විසින් සාදන ලද වර්ෂ 1999 ක් වූ සැප්තැම්බර් මස 05 වන දිනැති අංක 189/1999 පිඹුරේ ලොට් 1ඒ සහ ලොට් 1බී කැබැල්ලේ කොටසක්) ද ලොට් 2 කන්දෙවත්ත පාරේ වරිපනම් අංක 50/46 සහ 50/43 දරන පරිශ්‍රයන් ද මායිම් වන එකී අංක 8030 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් විසි අටකුත් දශම පහයි නවයක් (අ. 0, රූ. 0, පර්. 28.59) හෙවත් වඩාත් නිවැරදි ලෙස පර්චස් විසි නවයකුත් දශම නවයයි පහ (අ. 0, රූ. 0, පර්. 29.95) වන ඉඩම් කොටස.

අංක 8030 දරන පිඹුරේ එකී ලොට් අංක 1 මෙහි පහත දැක්වෙන ඉඩමෙන් බෙදා වන් කරන ලද කොටසක් වන්නේ ය.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, රාගම් පත්තුව, වත්තල මාබෝලේ නගර සභා සීමාව ඇතුළත වත්ත, පිහිටි කන්දගේවත්ත සහ බොළඳපතිරගේවත්ත සහ කුඹුර යනුවෙන් හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. බී. එල්. ප්‍රනාන්දු විසින් සාදන ලද වර්ෂ 2001 ක් වූ පෙබරවාරි මස 15 වන දිනැති අංක 4270 දරන පිඹුරේ ලොට් Y වශයෙන් සලකුණු කර දැක්වෙන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස, එකී ලොට් Y කැබැල්ලට, උතුරට බී. ප්‍රනාන්දු සහ රන්ජි විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද, නැගෙනහිරට අංක 3647 දරන පිඹුරේ ලොට් එක්ස් කැබැල්ල ද, සහ ඩබ්ලිව්. පෙරේරා සහ ටී. පීරිස් විසින් සහ වෙනත් අය විසින් කියනු ලබන ඉඩම ද, දකුණට අංක 3647 දරන පිඹුරේ ලොට් එක්ස් කැබැල්ල ද සහ ජේ. වී. ජී. පෙරේරා විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ අඩි 12 ක් පළල ප්‍රවේශ මාර්ගය ද සහ බස්නාහිරට බී. ප්‍රනාන්දු, කේ. ක්‍රිෂ්ණවේලු, ඒ විජයකුමාර, වී. ආනන්ද කුමාර සහ වෙනත් අය හිමිකම් පාන ඉඩම සහ ලොට් එක්ස් 2 කැබැල්ලේ (කොටසක්) ද, වන එහි පිහිටි ගහකොළ, පළතුරු සහ සියලුම දේ සමග වන ප්‍රමාණයෙන් පර්චස් තිස් එකකුත් දශම හතරයි බිංදුවක් (අ. 0, රූ. 0 පර්. 31.40) වන කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී. 918/273 යටතේ ලියාපදිංචි කර ඇති ඉඩම් කොටස.

බලයලත් මිනින්දෝරු එස්. සමරවික්‍රම විසින් සාදන ලද වර්ෂ 1999 ක් වූ සැප්තැම්බර් මස 05 වන දිනැති අංක 189/1999 දරන පිඹුරේ ලොට් 1ඒ මතින් සහ ඒ ඔස්සේ මාර්ග අයිතිවාසිකම ද සමග වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ රාගම් පත්තුව, වත්තල මාබෝලේ නගර සභා සීමාව ඇතුළත වත්තල පිහිටි, කන්දේගෙවත්ත සහ බොළඳපතිරගේවත්ත සහ කුඹුර යනුවෙන් හඳුවන්වනු ලබන බලයලත් මිනින්දෝරු එස්. සමරවික්‍රම විසින් සාදන ලද වර්ෂ 1999 ක් වූ සැප්තැම්බර් මස 5 වන දිනැති අංක 189/1999 දරන පිඹුරේ ලොට් 1ඒ වශයෙන් සලකුණු කර දැක්වෙන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස, එකී ලොට් 1 ඒ කැබැල්ලට, උතුරට ඇල සහ අංක 1854 දරන පිඹුරේ ලොට් ඩී ද, නැගෙනහිරට ලොට් 1බී ද, දකුණට දැන් අර්නස්ට් සුසන්ත පෙරේරා විසින් හිමිකම් කියනු ලබන අංක 3093 දරන පිඹුරේ ලොට් එෆ් 2 ද සහ බස්නාහිරට ප්‍රාදේශීය සභාවේ සිට නිවාස දක්වා වන මාර්ගය ද වන එහි පිහිටි ගහකොළ, පළතුරු සහ සියලුම දේ සමග වන ප්‍රමාණයෙන් පර්චස් දෙකයි දශම නවයයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 2.90) ක් වන කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 789/235 යටතේ ලියාපදිංචි කර ඇති ඉඩම් කොටස.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

උදිතා කොඩිකාර,
සහකාර කළමනාකාරිණිය - අයකරගැනීම්

10-142

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොළොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2013** | | | |
| ඔක්තෝබර් | 2013.10.04 | සිකුරාදා | 2013.09.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.10.11 | සිකුරාදා | 2013.09.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.10.17 | බ්‍රහස්පතින්දා | 2013.10.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.10.25 | සිකුරාදා | 2013.10.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| නොවැම්බර් | 2013.11.01 | සිකුරාදා | 2013.10.17 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2013.11.08 | සිකුරාදා | 2013.10.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.11.15 | සිකුරාදා | 2013.11.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.11.22 | සිකුරාදා | 2013.11.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.11.29 | සිකුරාදා | 2013.11.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| දෙසැම්බර් | 2013.12.06 | සිකුරාදා | 2013.11.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.12.13 | සිකුරාදා | 2013.11.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.12.20 | සිකුරාදා | 2013.12.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.12.27 | සිකුරාදා | 2013.12.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.